# වාර්ෂික වාර්තාව

# 2014

# පෙරවදන

1815 සිට බ්‍රිතාන්‍ය අධිරාජ්‍යවාදීන්ගේ යටත් විජිතයක්ව පැවති ශ්‍රී ලංකාවේ වතු වගාව ආරම්භ කිරීම තුළින් ඇති වූ ශ්‍රමික ඉල්ලුමට පිළියමක් ලෙස ඉංග්‍රීසි පාලකයින් කළේ දකුණු ඉන්දීය ශ්‍රමිකයන් මෙරටට ගෙන්වා ගැනීම ආරම්භ කිරීමයි. එම පසුබිම තුළ එම වතු සේවකයන්ගේ වැටුප ඇතුළු සුභසාධන කටයුතු පිළිබඳ මතු වූ ගැටළු සොයා විසඳුම් දීමට 1923 දී කම්කරු දෙපාර්තමේන්තුවේ ආරම්භය සිදු විය. පුරා දශක 09ක් තිස්සේ විකාශනය වූ කම්කරු දෙපාර්තමේන්තුව කම්කරු  අණපණත් 50කට ආසන්න ප්‍රමාණයක් ක්‍රියාත්මක කරමින්ද සේව්‍ය සේවක සබඳතාව තහවුරු කරමින්ද රාජ්‍ය අංශයේ කීර්තිමත් දෙපාර්තමේන්තුවක් බවට පත්ව ඇති අවධියක 2014 වාර්ෂික වාර්තාව ඔබ වෙත ඉදිරිපත් කිරීමට ලැබීම භාග්‍යයක් කොට සලකමි.

විවෘත ආර්ථිකය හා ගෝලීයකරණය සමඟ ශ්‍රී ලංකාවේ පෞද්ගලික අංශයේ රැකියා ක්ෂේත්‍ර සීඝ්‍රයෙන් පුළුල් වෙමින් පවතින අතර කම්කරු දෙපාර්තමේන්තුව එම ක්ෂේත්‍රයන් ආවරණය කරමින් කාර්මික සාමය ආරක්ෂා කිරීම හරහා රටේ දළ ජාතික නිෂ්පාදනය  නංවාලීමට සුවිශාල මෙහෙවරක් කර ඇත. සමාලෝචන වර්ෂය තුළදී රාජ්‍ය අංශයේ නිලධාරීන්ගේ වැටුප වැඩි වූ අතර එයට සමානුපාතිකව පෞද්ගලික අංශයේ සේවකයින්ගේ වැටුප් වැඩි කරන ලෙස අවස්ථා කීපයකදී අප ඉල්ලීම් කළ අතර එයට බොහෝ හාම්පුතුන් යහපත් ප්‍රතිචාරයක් දක්වා ඇති බව මෙහිලා සඳහන් කිරීමට කැමැත්තෙමි. මේ සඳහා නීතිමය ආවරණයක් දීමට කටයුතු කෙරෙමින් පවතී.

අපේක්ෂිත ඉලක්කයන් සපුරා ගැනීම සඳහා ප්‍රධාන කාර්යාලයේ මෙන්ම පළාත් කාර්යාල හා උප කාර්යාල වල සියළු අංශයන්හි නිලධාරීන්ගේ කැපවීම උනන්දුව තම ශක්ති ප්‍රමාණයෙන් ලබා දීම පිළිබඳව මාගේ ප්‍රශංසාව පුද කරමි. එසේම අවශ්‍ය වූ සෑම විටකම මගපෙන්වීම සිදු කරමින් දිරිමත් කළ කම්කරු අමාත්‍යාංශය හා ජාත්‍යන්තර කම්කරු සංවිධානයද අතිශයෙන් අගය කරන අතර ඒ සැමට ස්තූතිය පුද කර සිටීමට මෙය අවස්ථාවක් කර ගනිමි. රාජ්‍ය අංශයේ වගකීම ඉටු කරමින්සුවිසල් සේවාවක් රටට ලබාදීමට කම්කරු දෙපාර්තමේන්තුවේ සියළු දෙනාට ශක්තිය හා ධෛර්යය ලැබේවායි මම සුභ ප්‍රාර්ථනා කරමි.

එම්.ඩී.සී.අමරතුංග
කම්කරු කොමසාරිස් ජනරාල්
කම්කරු දෙපාර්තමේන්තුව

# පටුන


| | | |
|---|---|---|
| 01. | කම්කරු දෙපාර්තමේන්තුව | 01-02 |
| 02. | යහපත් කාර්මික සාමයක් උදෙසා දැරූ ප්‍රයත්න | 03-05 |
| 03. | වැටුප් හා සේවා කොන්දේසි මගින් සේවක ප්‍රජාවට සුරක්ෂිතභාවය | 06-07 |
| 04. | සමාජ ආරක්ෂණය පදනම් කරගත් වැඩසටහන් | 08-09 |
| 05. | වෘත්තීය සුරක්ෂිතතාවය හා සෞඛ්‍ය | 10-11 |
| 06. | කාන්තා හා ළමා කටයුතු උදෙසා දැක්වූ දායකත්වය | 12-14 |
| 07. | කම්කරු දෙපාර්තමේන්තුවේ පොදු පරිපාලනය | 15-17 |
| 08. | සංඛ්‍යාලේඛන සංග්‍රහය | 18-22 |

# කම්කරු දෙපාර්තමේන්තුව

**ඉතිහාසය**

ශ්‍රී ලංකාව බ්‍රිතාන්‍යය සතු යටත් විජිතයක්ව පැවති සමයේ බ්‍රිතාන්‍ය පාලකයන් විසින් ව්‍යාපාරික වතු වගාව යටතේ කෝපි වගාව හා තේ වගාව ව්‍යාප්ත කිරීමට උත්සුක වූ අතර ඊට ශ්‍රමය සැපයීම ස්වදේශිකයන් වූ සිංහලයන් විසින් ප්‍රතික්ෂේප කිරීමෙන් අනතුරුව වතු වගාව සඳහා වර්ෂ 1824 දී දකුණු ඉන්දීය දෙමළ කම්කරුවන් මෙරටට ගෙන්වා ඉතා අඩු වැටුපකට ඔවුන්ගේ ශ්‍රමය ලබා ගන්නා ලදී. මෙසේ ගෙන්වනු ලැබූ කම්කරු ප්‍රජාව මගින් ඇති වූ ජනගහනය වර්ෂ 1921 දී පැවැත්වූ ජන සංගණනයට අනුව සංඛ්‍යාත්මකව 602,700ක් දක්වා වර්ධනය වී තිබූ අතර මෙම පිරිසට සුබසාධනය සැපයීමේ අරමුණු පෙරදැරිව වර්ෂ 1923 අංක 01 දරණ "ඉන්දියානු ආගාමික කම්කරු ආඥා පනත" එවකට ශ්‍රී ලංකාව පාලනය කළ බ්‍රිතාන්‍ය ජාතිකයන් විසින් ක්‍රියාත්මක කිරීම අරඹන ලදී. මෙම පනතට අනුව "ඉන්දියානු ආගාමික කම්කරු පාලකවරයාගේ දෙපාර්තමේන්තුව" පිහිටුවීම, වත්මන් කම්කරු දෙපාර්තමේන්තුවේ මූලාරම්භය ලෙස පෙන්වා දිය හැකිය. ක්‍රමිකව ශ්‍රී ලාංකේය අනන්‍යතාවයක් සහිත කම්කරු ප්‍රජාවගේ වර්ධනයද සිදුවූ අතර මේ අනුව පොදුවේ ශ්‍රී ලාංකේය ශ්‍රම බලකාය අරබයා ඔවුන්ගේ සුබසාධන අපේක්ෂා මෙන්ම සේව්‍ය සේවක සබඳතාවයන් සුරක්ෂිත කිරීමට උරදෙන ප්‍රමුඛතම රාජ්‍ය ආයතනය බවට වර්තමානය වන විට කම්කරු දෙපාර්තමේන්තුව පත් වී ඇත.

**ආයතනික කාර්යභාරය**

සේව්‍ය සේවක හා රජය යන ත්‍රෛපාර්ශවික සම්බන්ධතාවය ශක්තිමත්ව පවත්වා ගැනීම තුළින් ජාතික ආර්ථිකය ශක්තිමත් කිරීම.

**දැක්ම**

ජාත්‍යන්තර තරඟකාරී ආර්ථිකයක් සඳහා කාර්මික සාමය තහවුරු වූ රටක්

**මෙහෙවර**

කාර්මික සාමය තහවුරු වූ යහපත් පරිසරයක් ස්ථාපිත කිරීම තුළින් ශ්‍රී ලංකාවේ සංවර්ධන ක්‍රියාවලියට දායක වීම.

**වර්තමාන තත්ත්වය**

වර්ෂ 1923 සිට වසර 91ක් තුළ ශ්‍රී ලංකා ව්‍යවස්ථාදායකය විසින් කම්කරු විෂයයට අදාළව අණපනත් 50ක් පමණ සම්මත කිරීමෙන් අනතුරුව නීතියෙන් බල ගැන්වූ එම අණපනත් බොහෝමයක් සඳහා පසුව එක් වූ සංශෝධන සහිතව ක්‍රියාවට නැංවීම කම්කරු දෙපාර්තමේන්තුවේ වර්තමාන කාර්යභාරය වී ඇත.

ශ්‍රී ලංකාවේ ජාතික ආර්ථිකය තුළ පෞද්ගලික අංශයේ දායකත්වය ප්‍රසාරණය වීමත් සමඟ කම්කරු දෙපාර්තමේන්තුවේ කාර්යභාරය පුළුල් වී ඇත. මෙසා විශාල කාර්යභාරයක් ඉටුකිරීම 2014 වසර අවසන් වන විට දෙපාර්තමේන්තුවේ සමස්ථ කාර්ය මණ්ඩලය වූයේ 2,256ක් පමණි.

රටපුරා විසිර සිටින කම්කරු ජනතාවට අනේකවිධ සේවාවන් සලසමින් යහපත් කාර්මික පරිසරයක් නිර්මාණය කිරීම උදෙසා කම්කරු දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයට අනුබද්ධව අංශ 13ක් ක්‍රියාත්මකව පවතින අතර කම්කරු දෙපාර්තමේන්තුවේ කටයුතු විමධ්‍යගත කිරීම යටතේ කලාප කම්කරු කාර්යාල 11ක්, දිස්ත්‍රික් කම්කරු කාර්යාල 39ක්, උප කම්කරු කාර්යාල 18ක් හා දිස්ත්‍රික් කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරු කාර්යාල 10ක් දිවයින පුරා ස්ථාපිත කර ඇත.

# යහපත් කාර්මික සාමයක් උදෙසා දැරූ ප්‍රයත්න

## ජාතික අවශ්‍යතාවයන් සපුරාලීම


"සර්වග්‍රාහී සංවර්ධන සංකල්පය" ශ්‍රී ලාංකේය ජාතික සංවර්ධන ක්‍රමෝපාය ලෙස ජාතික ප්‍රතිපත්ති සම්පාදකයින් විසින් හඳුන්වා දීමෙන් අනතුරුව සෑම අංශයකම වේගවත් සංවර්ධන ක්‍රියාදාමයකට අවතීර්ණ වී සිටින සමස්ත ශ්‍රී ලාංකේය ප්‍රජාවගේම අදිටන වන්නේ රට තුළ මනා කාර්මික සාමයක් පැවතීමයි.


වැඩබිම් තුළ හා සේවා සපයන ආයතනවල සේව්‍ය සේවක ප්‍රජාව මනා සහයෝගයෙන් මෙන්ම අන්‍යෝන්‍ය අවබෝධයෙන් යුතුව කටයුතු කිරීම මගින් වැඩවර්ජන සහ ආරවුල් වලින් තොරව දෛනික කටයුතු පවත්වාගෙන යාම මගින් ඇති කරගනු ලබන කාර්මික සාමය රැඳි වාතාවරණය අපේක්ෂිත සංවර්ධන තත්ත්වයන් ළඟා කර ගැනීමේ ප්‍රමුඛතම හේතු සාධකය වී ඇත. මෙවන් වැදගත් ජාතික කර්තව්‍යයකට දායක වීම කම්කරු දෙපාර්තමේන්තුව සිය වගකීම හා යුතුකම ලෙස සලකා ප්‍රශංසනීය මෙහෙවරක් ඉටුකරමින් සිටින වග අවිවාදිත කරුණක් ලෙස දැක්විය හැකි වන අතර එවන් සාධනීය මෙහෙයක් ඉටු කිරීමට කම්කරු දෙපාර්තමේන්තුව 2014 වර්ෂයේදී විවිධ අංශ මගින් දිවයින පුරා දියත් කරන ලද සියළු කාර්යභාරය මතු දක්වා ඇත.

## කම්කරු පරීක්ෂණ

තෘප්තිමත් ශ්‍රම බලකායක් කිසියම් රටක පැවතීම එම රටෙහි සංවර්ධන ක්‍රියාදාමයට මහඟු පිටුවහලක් සපයන බවට පවතින විශ්වාසය පෙරදැරිව යහපත් කාර්මික සාමයක් උදෙසා කම්කරු දෙපාර්තමේන්තුව සතු නිලධාරීන් විසින් දිවයින පුරා සිදු කරනු ලබන කම්කරු පරීක්ෂණ මගින් රටේ සමස්ථ ඵලදායිතාවය ඉහළ නැංවීමට හේතු සාධක වන බව ප්‍රත්‍යක්ෂ වී ඇත. එමෙන්ම මෙම කම්කරු පරීක්ෂණ නොපැවැත්වීම තුළින් කාර්මික ආරවුල් වර්ධනය වී නිරන්තරයෙන් වැඩවර්ජන ඇති වීමත්, හීන ඵලදායිතාවයක් ඇතිවන තත්ත්වයක් ද උදාවන බවද පැවසිය හැකිය.

පහත ප්‍රස්ථාර දෙක මගින් පසුගිය වසර 05ක කාල සීමාව තුළ කම්කරු නිලධාරීන් විසින් දිවයින පුරා සිදු කරන ලද කම්කරු පරීක්ෂණ සංඛ්‍යාව හා වාර්තා වූ කාර්මික ආරවුල් සංඛ්‍යාව දක්වා ඇත.




කම්කරු ආරවුල් ප්‍රමාණය දිගින් දිගටම පහළ යාම 2014 වර්ෂයේදී ද සිදුව ඇති බව, ඒ පිළිබඳව විමර්ශනය කිරීමේදී දෘශ්‍යමාන වේ. මීට හේතු ලෙස දැක්විය හැක්කේ කම්කරු පරීක්ෂණ ක්‍රියාවලිය ශක්තිමත් කිරීමත්, දෙපාර්තමේන්තුවේ විවිධ අංශ මගින් ජනමාධ්‍ය ඉවහල් කරගෙන කරනු ලබන දැනුවත් කිරීම් පුළුල් වීමත් යනාදී කරුණු බලපෑමෙන් කම්කරු ආරවුල් මේ අයුරින් අවම වී ඇති බවයි. මේ සඳහා සමාජ කතිකා අංශය මගින් පැවැත්වූ වැඩසටහන් මෙන්ම කලාප හා දිස්ත්‍රික් කාර්යාල මගින් පැවැත්වූ වැඩසටහන් රාශියක් ඉවහල් වූ බවට හේතු සාධක පවතී.

**පරීක්ෂණවල ගුණාත්මකභාවය**

නිතිපතා සිදුකරනු ලබන කම්කරු පරීක්ෂණ වල ගුණාත්මකභාවය වඩාත් වැඩිදියුණු කිරීමට කම්කරු දෙපාර්තමේන්තුව නොමඳ උත්සාහයක යෙදීම නිරන්තරයෙන් සිදු කරන බැවින් මෙම අරමුණ සාක්ෂාත් කරගනු පිණිස කලාපීය මට්ටමින් ප්‍රගති සමාලෝචන රැස්වීම් 2014 වර්ෂයේදී 05ක් පවත්වා ඇති අතර මෙමගින් කම්කරු නිලධාරීන් සිදු කරනු ලබන පරීක්ෂණවල දුර්වලතා අඩුපාඩු හඳුනාගෙන ඒවා නිවැරදි කර ගැනීමට උපදෙස් ලබා දී ඇත.

**වැඩ වර්ජන**

2014 වර්ෂය තුළදී අර්ධ රාජ්‍ය අංශයේ හා පෞද්ගලික අංශයේ සිදුකරන ලද වැඩවර්ජන 38ක් දෙපාර්තමේන්තුවේ දිස්ත්‍රික් හා උප කම්කරු කාර්යාල වෙත වාර්තා වී ඇති අතර, ඉහත දැක්වූ සියළු වැඩවර්ජන වලට සේවකයන් 6,451ක් සහභාගී වී ඇති අතර, එම වැඩවර්ජන හේතුවෙන් අහිමි වූ මිනිස් ශ්‍රම දින ගණන 37,323ක් වී ඇතැයි ගණන් බලා ඇත. මෙම තත්ත්වය වනාහි පසුගිය වර්ෂයට වඩා ඉතා පහළ අගයක් ගන්නා අතර ඊට හේතු වශයෙන් දැක්විය හැක්කේ කාර්මික සම්බන්ධතා අංශයේ මැදිහත්වීම මගින් සේවා හා නිෂ්පාදන ආයතනවල ඉහළ කළමනාකාරීත්වය හා එහි පවතින වෘත්තීය සමිති අතර මනා සංවිධිත සම්බන්ධීකරණයක් පවත්වාගෙන යාම තුළින් ඉහත දැක්වූ යහපත් වාතාවරණය ලබා ගැනීමට හැකියාව ලද බවයි.

**ආරවුල් විසඳීම**

දිවයින පුරා සංවිධිතව ක්‍රියාත්මක වන කම්කරු දෙපාර්තමේන්තුවේ දිස්ත්‍රික් හා උප කම්කරු කාර්යාල ජාලය වෙත ලද 2013 වර්ෂයෙන් ඉතිරිව නොවිසඳුනු කම්කරු පැමිණිලි ද ඇතුළත්ව පැමිණිලි 6,038ක් 2014 වර්ෂයේ දී විසඳීමට හැකියාව ලැබී ඇත. එමෙන්ම විශේෂ විමර්ශන අංශයට කරන ලද පැමිණිලි 216ක් පිළිබඳවද නියමිත පරිදි පරීක්ෂණ පවත්වා ඇත.

**නීති කටයුතු**

2014 වර්ෂයේදී පාරිතෝෂික පනත, කාර්මික ආරවුල් පනත, සේවය අවසන් කිරීමේ පනත, පඩිපාලක සභා ආඥා පනත යනාදී පනත් යටතේ නඩු බොහෝ ගණනක් පවරා තිබුණි. එමෙන්ම සාප්පු හා කාර්යාල සේවක පනත යටතේද , ප්‍රසූතිකාධාර ආඥා පනත යටතේද, ස්ත්‍රීන් තරුණ අය හා ළමයින් සේවයේ යෙදවීමේ පනත යටතේද, සේවක අර්ථසාධක අරමුදල් පනත යටතේද, කම්කරු විනිශ්චය සභා නියෝග අනුවද, අයවැය සහන දීමනා පනත යටතේද, අනුමත අර්ථසාධක අරමුදල් පනත යටතේද නඩු පවරා තිබුණි. මේ අනුව නීති ක්‍රියා අංශය මගින් 2014 වර්ෂයේ පවරනු ලැබූ සමස්ථ නඩු සංඛ්‍යාව 6,038කි.

## වැටුප් හා සේවා කොන්දේසි මගින් සේවක ප්‍රජාවට සුරක්ෂිතභාවය

ලක්ෂ 70කට අධික ශ්‍රමිකයන් පිරිසක් නියෝජනය කරනු ලබන ශ්‍රී ලාංකේය පෞද්ගලික අංශයේ සේවක ප්‍රජාවගේ ජීවන තත්ත්වය වඩාත් යහපත් කිරීමෙන් ඔවුන්ගේ අනාගතය සුරක්ෂිත කරනු පිණිස, ඔවුන් වැය කරනු ලබන ශ්‍රමයට සරිලන වැටුපක් ලබාදීමේ අදිටනින් යුතුව පිළිගත හැකි සේවා කොන්දේසි පැණවීමෙන් ශ්‍රම සූරාකෑමට ඉඩ නොතබමින් සේව්‍ය සේවක දෙපක්ෂය අතර යහපත් සබඳතාවයන් වර්ධනය කිරීමේ අභිලාශයද ඇතිව ක්‍රියාත්මක වන ශ්‍රම ප්‍රමිති අංශය වූ කලී කම්කරු දෙපාර්තමේන්තුව සතු සක්‍රිය අංශයක් ලෙස හඳුන්වා දිය හැක.

1941 අංක 27 දරණ පඩිපාලක සභා ආඥාපනත, 1954 අංක 19 දරණ සාප්පු හා කාර්යාල සේවකයින් පිළිබඳ (සේවය හා වේතන විධිමත් කිරීමේ) පනත, 2005 අංක 36 දරණ සේවකයන්ගේ අයවැය සහන දීමනා පනත යනාදී පනත්හි විධිවිධාන ක්‍රියාවට නැංවීම ශ්‍රම ප්‍රමිති අංශය විසින් සිදු කරනු ලබයි.

2014 වර්ෂයේදී ශ්‍රම ප්‍රමිති අංශය මගින් නැව් තටාක, තොටුපළවල් හා වරායන්හි ප්‍රවාහන කර්මාන්තය පිළිබඳව පඩි පාලක සභාව ප්‍රතිව්‍යුහගත කිරීමට අදාළ කටයුතු සිදුකරනු ලැබූ අතර, බොහෝ සේව්‍ය සේවක පිරිසක් නියෝජනය කරනු ලබන ක්ෂේත්‍රයක් ලෙස දිනෙන් දින වර්ධනය වෙමින් පවතින පෞද්ගලික අධ්‍යාපන ආයතන සඳහා පඩිපාලක සභාව පිහිටුවීමට අවශ්‍ය මූලික තොරතුරු රැස් කිරීම සිදු කරනු ලැබීය.

නව කර්මාන්තයක් ලෙස ව්‍යාප්තව පවතින දිවයිනේ බොහෝ සේවක පිරිසක් නියෝජනය කරනු ලබන පානීය ජලය බෝතල් කිරීමේ කර්මාන්තය සඳහා අයිස්, සිසිල් බීම, පළතුරු යුෂ හා ජෑම් සෑදීමේ කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාවේ ආවරණය ලබාදීම සම්බන්ධයෙන් තොරතුරු රැස් කිරීම සිදු කර ඇත.

දිවයින පුරා ව්‍යාප්තව පවතින පවිත්‍රතා සේවා කර්මාන්තයේ අතිකාල ගෙවීම පිළිබඳව තීරණ ගැසට් කිරීම තුළින් මෙම ක්ෂේත්‍ර සේවා කොන්දේසි විධිමත් කිරීම යනාදී කටයුතු ශ්‍රම ප්‍රමිති අංශය මගින් 2014 වර්ෂයේදී සිදු කර ඇත.

එමෙන්ම ශ්‍රම ප්‍රමිති අංශය මගින් සිය කටයුතු සිදු කිරීමේදී නිල කාලය අවසන් වූ හා නියෝජිතයන් පුරප්පාඩු වූ පඩි පාලක සභාවලට නව නියෝජිතයන් පත්කිරීම මගින් එම පඩිපාලක සභා සක්‍රීය කිරීමත්, කොකෝවා, කරදමුංගු, ගම්මිරිස් වැවීමේ හා සැදීමේ කර්මාන්තය පිළිබඳ පඩි පාලක සභාවේ අවම වැටුප් නිවේදන හා මාසික ජීවන වියදම් දර්ශාංකය සලකා ප්‍රසිද්ධ කිරීම සිදු කර ඇත.

පසුගිය 2013 වර්ෂයේ අවම වැටුප් වැඩි කිරීම සිදු නොවූ තේ, රබර්, පොල්, කුරුඳු වැවීමේ කර්මාන්තවලට අදාළ පඩිපාලක සභා 04හි අවම වැටුප නිකුත් කිරීම යනාදී වැඩසටහන් රාශියකට 2014 වර්ෂයේදී ශ්‍රම ප්‍රමිති අංශය විසින් සිය දායකත්වය ලබා දී ඇත.

## සමාජ ආරක්ෂණය පදනම් කරගත් වැඩසටහන්

ශ්‍රී ලංකාවේ පෞද්ගලික හා අර්ධ රාජ්‍ය අංශයේ සේවයේ යෙදී සිටින හැත්තෑ දෙලක්ෂයක් පමණ වූ සේවක පිරිසගේ විශ්‍රාම දිවිය සාර්ථකව ගත කිරීමට මහඟු අත්වැලක් වීමේ අදිටනින් යුතුව 1958 ජුනි මස 01 වන දින පිහිටුවන ලද ඉතා වැදගත් වූ සමාජ ආරක්ෂණ ක්‍රමයක් ලෙස සේවක අර්ථසාධක අරමුදල හඳුන්වා දිය හැක.


ආරම්භයේ සිට වර්තමානය දක්වාම මෙම අරමුදලේ පරිපාලන කටයුතු කම්කරු කොමසාරිස් ජනරාල් විසින්ද, මූල්‍ය පාලන කටයුතු ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින්ද සිදු කරනු ලබනුයේ එම පනතින් අනුදත් විධිවිධාන අනුගමනය කිරීමෙනි.

**සේවක අර්ථසාධක අරමුදල**

සේවක අර්ථසාධක අරමුදලට අදාළ දායක මුදල් අදාළ සේවකයාගේ මාසික වැටුපෙන් 8%ක් හෝ 10%ක ප්‍රතිශතයක්ද, අදාළ සේව්‍යයා විසින් පිළිවෙලින් 12%ක හෝ 15%ක ප්‍රතිශතයක්ද මාසිකව සේවකයාගේ නමින් ඇති ගිණුමකට බැර කිරීමෙන්ද එම මුදල් තැන්පත්ව පවතින මහ බැංකුව මගින් මාසිකව 11%කට ආසන්න පොළී ප්‍රතිශතයක් එම මුදලට එකතු කිරීමෙන් සේවක අර්ථසාධක අරමුදලේ දායකත්වය සමන්විත වේ.

සේවක අර්ථසාධක අරමුදල් පනත බලාත්මක කිරීමේදී පනවා ඇති විධිවිධාන අනුව පනතින් ආවරණය කරනු ලබන සියළු සේවකයින් උදෙසා වන දායක මුදල් අදාළ සේවායෝජකයින් විසින් ඊළඟ මාසයේ අවසන් දින හෝ ඊට පෙර ශ්‍රී ලංකා මහ බැංකුවේ තැන්පත් කළ යුතුය.

පසුගිය වර්ෂ 05ක කාල සීමාව තුළ දායක මුදල් රැස් කිරීමේ ප්‍රගතිය පහත ප්‍රස්ථාර හා සංඛ්‍යාලේඛන වගු ඇසුරින් දක්වා ඇත.




**සේවක අර්ථසාධක අරමුදල් අයකර ගැනීම, පරිගණකගත කිරීම හා එහි ප්‍රගතිය**

සේවක අර්ථසාධක අරමුදල් අධීක්ෂණ තොරතුරු පද්ධතිය, නුවරඑළිය දිස්ත්‍රික් කම්කරු කාර්යාලයේ හැර අනෙකුත් සියළු දිස්ත්‍රික් කම්කරු කාර්යාලවලද නාවලපිටිය, බෙලිඅත්ත, වෙන්නප්පුව හා වරකාපොළ යන උප කම්කරු කාර්යාලවලද ස්ථාපනය කර ඇත. ඉහත තොරතුරු පද්ධතිය ස්ථාපනය කිරීමෙන් පසුව 2014 වර්ෂයේදී ප්‍රථම නිවේදන නිකුත් කිරීම් 7,922ක්ද, නිකුත් කළ රතු නිවේදන සංඛ්‍යාව 6,008ක්ද, අයකර ගත් මුදල රු. 278,632,201.00ක් වී ඇත. එමෙන්ම සේවක අර්ථසාධක අරමුදලට අදාළ ගෙවීම් තොරතුරු පද්ධතිය දිවයිනේ සියළුම දිස්ත්‍රික් කම්කරු කාර්යාලවලද නාවලපිටිය හා බෙලිඅත්ත උප කම්කරු කාර්යාල දෙකේද ස්ථාපනය කර ඇත.

2014 වර්ෂයේ දී අනුමත අර්ථසාධක අරමුදල් අධීක්ෂණය සම්බන්ධ කටයුතු පිළිබඳව කරුණු ඉදිරිපත් කිරීමේදී 2014.12.31 දින වන විට දෙපාර්තමේන්තුව මගින් අධීක්ෂණය කරනු ලබන අනුමත අර්ථසාධක අරමුදල් සංඛ්‍යාව 157කි. 2014 වර්ෂයේදී සිදු කරන ලද ආයතන පරීක්ෂණ සංඛ්‍යාව 214කි. පැමිණිලි පරීක්ෂණ සංඛ්‍යාව 165කි.

## වෘත්තීය සුරක්ෂිතතාවය හා සෞඛ්‍ය

විවිධ සේවා ස්ථානවල විවිධ සේවාවන්හි යෙදී සිටින සේවක ප්‍රජාව සිය සේවාවන් ඉටු කිරීමේදී විවිධාකාර අනතුරු, ආපදා, වෘත්තීමය රෝගාබාධවලට ලක්වීමෙන්ම සිය රැකියා කටයුතු ආශ්‍රිතව ඇතිවන අයහපත් සෞඛ්‍ය තත්ත්වයන් වර්ධනය වීම තමන් සේවය කරනු ලබන සේවා පරිසරය දූෂණයට ලක්වීම යනාදී සේවක ප්‍රජාවගේ වෘත්තීය සෞඛ්‍ය තත්ත්වයට පීඩා ගෙන දෙන අහිතකර තත්ත්වයන් රැසක් වර්තමානයේ දිනපතාම පාහේ අසන්නට දකින්නට ලැබෙන තරමට සුලභ වී පවතින අතර මෙම අයහපත් තත්ත්වයන් දුරුකරලීම උදෙසා ක්‍රියාකිරීමත්, කම්කරු ප්‍රජාවගේ සුබසාධනය හා වෘත්තීය ආරක්ෂාව මෙන්ම වෘත්තීය අභිවර්ධනය වෙනුවෙන් නිරන්තරයෙන් සිය කටයුතු සම්පාදනය කරනු ලබන කම්කරු දෙපාර්තමේන්තුව ඉහත කරුණු කෙරෙහි දැඩි අවධානයකින් යුතුව කටයුතු සිදු කරනු ලබයි.

මෙම කටයුතු සඳහා දෙපාර්තමේන්තුවේ වගකීම පැවරූ අංශ ලෙස වෘත්තීය ස්වස්ථතා අංශය සහ කර්මාන්තමය සුරක්ෂිතතා අංශය කටයුතු කරනු ලැබූ අතර, අනතුරු හා උපද්‍රව වලින් තොර වූ වෘත්තීය සෞඛ්‍ය තත්ත්වයන් මනාව සුරැකෙන සේවා පරිසරයක් බිහි කිරීමේ උදාර කර්තව්‍යයට කම්කරු දෙපාර්තමේන්තුව විසින් උරදෙනු ලබනුයේ එවන් යහපත් සේවා පරිසරයකදී සේවකයන්ගේ කාර්යක්ෂමතාවය හා ඵලදායිතාවය ඉහළ යාමට හේතුසාධක වන බලපෑම පිළිබඳව අවධානය යොමු කරමිනි.

1942 අංක 45 දරණ කර්මාන්තශාලා ආඥා පනත අනුව සේවක ප්‍රජාවගේ වෘත්තීය සුරක්ෂිතතාව හා සෞඛ්‍ය හා සුබසාධනය සැකසීම අනිවාර්ය නෛතික අවශ්‍යතාවයක් ලෙසට නීත්‍යානුකූලභාවය ලබා දී ඇත.

"ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය සතිය" වෙනුවෙන් කර්මාන්තමය සුරක්ෂිතතා අංශය සහ වෘත්තීය සෞඛ්‍ය අංශයේ සම සංවිධානත්වයෙන් සම්මන්ත්‍රණයක් ගලධාරී හෝටලයේ පවත්වන ලදී.

කර්මාන්තමය සුරක්ෂිතතා අංශයේ සහයෝගය ලබා දීම මත, පෞද්ගලික අංශයේ සේවා හා නිෂ්පාදන ආයතන කිහිපයකම වෘත්තීය සෞඛ්‍ය පිළිබඳව සේවක ප්‍රජාව දැනුවත් කිරීමේ වැඩසටහන් රැසක් පැවැත්වූ අතර දිස්ත්‍රික් කර්මාන්තශාලා පරීක්ෂක ඉංජිනේරුවරුන්ගේ සහභාගිත්වයෙන් වෘත්තීය සෞඛ්‍ය හා කර්මාන්තමය සුරක්ෂිතතාවය පිළිබඳව කම්කරු ප්‍රජාව දිස්ත්‍රික් මට්ටමින් දැනුවත් කරනු ලැබීය.

සේවක අර්ථසාධක අරමුදලේ වෛද්‍ය නිර්දේශ ලබා දීම උදෙසා පැවැත්වූ වෛද්‍ය මණ්ඩල සංඛ්‍යාව 12ක් වූ අතර නිර්දේශ ලබා දීමට පරීක්ෂා කළ සේවක සංඛ්‍යාව 650කි. ආබාධිත තත්ත්වයට පත් වූ සේවක ප්‍රජාව පරීක්ෂා කර වන්දි නිර්දේශ කිරීම මත සේවකයන් 62ක් වෙනුවෙන් වන්දි ලබා දීමට කටයුතු කර ඇත. වෘත්තීය ස්වස්ථතා අංශයේ සහයෝගය ලබාදීම මත, පෞද්ගලික අංශයේ සේවා හා නිෂ්පාදන ආයතන කිහිපයකම වෘත්තීය  සෞඛ්‍ය පිළිබඳව සේවක ප්‍රජාව දැනුවත් කිරීමේ වැඩසටහන් රැසක් පැවැත්වෙන ලදී.

ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනය විසින් සංවිධානය කරන ලද ජාතික සුරක්ෂිතතා සම්මාන ප්‍රධානය සඳහා වූ ක්ෂේත්‍ර පරීක්ෂණ ඇගයීම ඉංජිනේරුවරුන්ගේ සහභාගීත්වයෙන් ද කරන ලදී.

# කාන්තා හා ළමා කටයුතු උදෙසා දැක්වූ දායකත්වය

**කාන්තා කටයුතු**

ශ්‍රී ලංකාවේ නිෂ්පාදන ක්‍රියාවලිය තුළ විශේෂ දායකත්වයක් කාන්තා සේවා නියුක්තිය විසින් ඉටු කරනු ලබන අතර එම වැඩකරන කාන්තාවන්ගේ වෘත්තීය අයිතිවාසිකම් හා ආරක්ෂාව මෙන්ම කාන්තා සෞඛ්‍ය හා සුබසාධනය සම්බන්ධ පහසුකම් හා වරප්‍රසාද සැලසීමේ අරමුණින් කම්කරු දෙපාර්තමේන්තුවේ කාන්තා හා ළමා කටයුතු අංශය මගින් කාන්තාවන්ට විශේෂ අණපනත් කිහිපයක් ක්‍රියාත්මක කරනු ලබයි.

**ළමා කටයුතු**

එසේම ජාතියේ ජීවය බඳු ළමා පරපුර කායිකව හා මානසිකව සමෘද්ධිමත් කිරීම පිණිස ඔවුන්ගේ අයිතීන් සුරක්ෂිත කිරීමේ විශ්ව ව්‍යාප්ත වගකීම වෙනුවෙන් කාන්තා හා ළමා කටයුතු අංශය මගින් ශ්‍රී ලංකාවේ ළමා මෙහෙකාර සේවය තුරන් කිරීම උදෙසා ළමා ශ්‍රමය පිටු දැකීම, වැඩ කිරීම සම්බන්ධ ළමයකුගේ වයස තීරණය කිරීම, ළමයෙකු නොයෙදිය යුතු අනර්ථකාරී සේවාවන් විග්‍රහ කිරීම මෙන්ම ළමා ශ්‍රමිකයන් ගෘහ සේවාවන්හි හා අවධානම් සේවාවන්හි යෙදවීමේ ගැටළුවට පිළියම් ලෙස ළමා ශ්‍රමය වැළැක්වීමේ මූලික අරමුණින් යුතුව ඒ සම්බන්ධව ලැබෙන පැමිණිලි විභාග කිරීම හා එම සේවායෝජකයින් නීතිය ඉදිරියට පමුණුවා පරීක්ෂණ කරනු ලබයි. මෙම අංශය මගින් පහත සඳහන් අණපනත් ක්‍රියාත්මක කරනු ලබයි.

01. 1956 අංක 47 දරණ ස්ත්‍රීන්, තරුණ අය හා ළමයින් සේවයේ යෙදවීමේ පනත
02. 1939 අංක 32 දරණ ප්‍රසූතිකාධාර ආඥා පනත
03. 1954 අංක 19 දරණ සාප්පු හා කාර්යාල සේවක පනත
04. 1942 අංක 45 දරණ කර්මාන්තශාලා ආඥා පනත

**ජාත්‍යන්තර කාන්තා දිනය**

2014 මාර්තු මස 08 වන දිනට යෙදී තිබූ ජාත්‍යන්තර කාන්තා දිනය සැමරීම නිමිත්තෙන් පිළියන්දලදී අඩු ආදායම්ලාභී කාන්තාවන් හා පාසල් හැරගිය යුවතියන් 200 දෙනෙකු හට එක් දින පුහුණු වැඩමුළුවක් පවත්වන ලදී.

**ලෝක ළමා දිනය**

2014.10.01 දිනට යෙදුන ලෝක ළමා දිනය උදෙසා කොළඹ දිස්ත්‍රික්කයේ අඩු ආදායම්ලාභී පාසල් ළමුන් සඳහා වෛද්‍ය සායනයක් පවත්වා, අඩු ආදායම් ලාභී පාසල් දරුවන් 400 දෙනෙකු සඳහා පාසල් හැර යාම වැළැක්වීම සඳහා පාසල් උපකරණ ලබා දෙන ලදී.

වැඩකරන කාන්තාවන් දැනුවත් කිරීමේ වැඩ සටහන් මගින් කාන්තාවන්ට බලපාන නීති හා සමාජ සංරක්ෂණ නීති පිළිබඳව වැවිලි අංශයේ සේවිකාවන් සඳහා සම්මන්ත්‍රණ 20ක් පවත්වන ලදී. මේ සඳහා එක් වැඩසටහනකට වතු සේවිකාවන් 30 දෙනෙකු බැගින් සහභාගී කරවාගෙන දිස්ත්‍රික් කම්කරු කාර්යාල මගින් මෙම වැඩසටහන සංවිධානය කරන ලදී.

වැඩකරන කාන්තාවන් දැනුවත් කිරීමේ (කාන්තාවන්ට බලපාන නීති හා සමාජ සංරක්ෂණ නීති පිළිබඳව) සේවාස්ථ සම්මන්ත්‍රණ 70ක් පැවැත්වීමට නියමිතව තිබූ අතර එයින් සම්මන්ත්‍රණ 57ක් නිම කර ඇත.

ආයෝජන කලාපවල කාන්තා සේවිකාවන්ගේ පෞද්ගලික හා මානසික ගැටළුවලට ආමන්ත්‍රණය කිරීම උදෙසා උපදේශන සේවාවන් කටුණායක, බියගම, කොග්ගල හා අවිස්සාවේල්ල කලාප තුළ ක්‍රියාත්මක කරන ලදී.

**කාන්තාවන් රාත්‍රී සේවයේ යෙදවීම**

කාන්තාවන් රාත්‍රී සේවයේ යෙදවීමට අවසර ලබා දීම සඳහා දිස්ත්‍රික් කාර්යාල හා ඒකාබද්ධව පරීක්ෂණ 125ක් සිදු කිරීමට නියමිතව තිබූ අතර එයින් පරීක්ෂණ 116ක් සිදු කරන ලදී. ඊට අමතරව රාත්‍රී සේවයේ යෙදීමට ආයතන 315කට අනුමැතිය ලබා දී ඇත. කාන්තාවන් රාත්‍රී සේවයේ යෙදවීම සම්බන්ධයෙන් පැමිණිලි 10ක් ලැබී ඇති අතර, ඒ සඳහා අවශ්‍ය උපදෙස් ලබා දී ඇත.

**ළමා මෙහෙකාර සේවය පිළිබඳ පැමිණිලි හා පරීක්ෂණ**

ළමා හා කාන්තා කාර්යාංශය මගින්, ජාතික ළමා ආරක්ෂක අධිකාරිය මගින් විවිධ ආයතන හා පුද්ගලයින්ගෙන් නාමිකව හා නිර්නාමිකව ලැබෙන ළමා මෙහෙකාර සේවක පැමිණිලි විභාග කර බැලීම හා එම සේවා යෝජකයන්ට විරුද්ධව නීතිමය කටයුතු සිදු කිරීම මෙම අංශය මගින් සිදු කරනු ලබයි.

2014 වර්ෂයේදී මෙම අංශය වෙත ළමයින් සේවයේ යෙදවීම සම්බන්ධයෙන් ලැබුණු

| | |
|---|---|
| පැමිණිලි සංඛ්‍යාව | - 141 |
| උසාවිගත කරන ලද පැමිණිලි සංඛ්‍යාව | - 09 |
| නීතිමය පියවර ගැනීමට කටයුතු කරමින් සිටින සංඛ්‍යාව | - 02 |
| ළමා සේවයක් බව අනාවරණය නොවූ සංඛ්‍යාව | - 67 |
| විමර්ශනය වෙමින් පවතින සංඛ්‍යාව | - 63 |

අනර්ථකාරී ළමා ශ්‍රමය පිටු දැකීම සම්බන්ධයෙන් සමාජ කොටස්කරුවන් දැනුවත් කිරීමේ වැඩසටහන් 31ක් කෑගල්ල හා අම්පාර දිස්ත්‍රික්කවල පවත්වන ලදී. ඒ අනුව අම්පාර දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 20ක වැඩසටහන් 20ක් ද කෑගල්ල දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 11ක වැඩසටහන් 11ක් ද පවත්වන ලදී.

## කම්කරු දෙපාර්තමේන්තුවේ පොදු පරිපාලනය

කම්කරු දෙපාර්තමේන්තුව වූ කලී නිරන්තරයෙන් ජනතාව අතරට ප්‍රවිෂ්ඨ වී සිය සේවාවන් සේව්‍ය සේවක ප්‍රජාව වෙත සැපයීමට සැදී පැහැදී සිටින්නා වූද නිබඳවම අවධියෙන් යුතුව සිටින බහුතර සේවක ප්‍රජාවක් නියෝජනය කරනු ලබන්නකි. එබැවින් මෙවැනි අනගිභවනීය සේවයක් සලසන කම්කරු දෙපාර්තමේන්තුවේ සේවයේ යෙදී සිටින සේවක ප්‍රජාව ද නිරතුරුවම තෘප්තිමත්ව සිය සේවය ඉටු කිරීමට අවශ්‍ය වාතාවරණය සැලසීමට අවශ්‍ය පසුබිම වඩාත් සංවිධිතව නිර්මාණය කිරීම මගින් කම්කරු දෙපාර්තමේන්තුවේ සේවක පිරිසගෙන් ප්‍රශස්ථ සේවයක් ලබා ගත හැකි බව අවිවාදිතය. මෙවන් භාරදූර්ය කාර්යයක් භාරව සිටින කම්කරු දෙපාර්තමේන්තුව මෙහෙයවනු ලබන්නේ පරිපාලන හෙවත් ආයතන අංශයයි. ආයතන අංශය විසින් දෙපාර්තමේන්තුවේ අභිවෘද්ධියට මෙන්ම මෙහි සේවය කරනු ලබන සේවක පිරිසගේ අභිවෘද්ධියට හේතු සාධක වන පරිදි දෙපාර්තමේන්තුව සතු භෞතික, මානව හා මූල්‍යමය සම්පත් මනා සංකලනයෙන් යුතුව ප්‍රශස්ථ ප්‍රතිඵල ලැබෙන පරිදි කළමනාකරණය කරනු ලැබිනි.

ආයතන අංශය විසින් 2014 වර්ෂයේදී ඉටු කළ කාර්යභාරය මෙසේ විග්‍රහ කළ හැක. නව බඳවා ගැනීම් ලෙස කම්කරු දෙපාර්තමේන්තුවෙන් උසස් වීම් ලද සහකාර කම්කරු කොමසාරිස්වරුන්, නීති නිලධාරීන්, සේවක අර්ථසාධක අරමුදලේ කටයුතු සඳහා ලිපිකරුවන්ද, නේවාසිකාගාර පාලිකාවන්, රියදුරන් සහ කාර්යාල කාර්ය සහායකයින්, මුරකරුවන් යනාදී වශයෙන් එම පිරිස 47ක් විය.

| | | |
|---|---|---|
| සහකාර කම්කරු කොමසාරිස්වරුන් (දෙපාර්තමේන්තුගත) | - | 15 |
| නීති නිලධාරීන් | - | 02 |
| ලිපිකරු (සේවක අර්ථසාධක අරමුදල) | - | 13 |
| නේවාසිකාගාර පාළිකා | - | 02 |
| රියදුරු | - | 05 |
| කාර්යාල කාර්ය සහයක | - | 02 |
| මුරකරු | - | 08 |

ඒකාබද්ධ සේවයෙන් හා දීප ව්‍යාප්ත සේවාවන්ගෙන් දෙපාර්තමේන්තුවට අනුයුක්ත කිරීම මත ශ්‍රී ලංකා පරිපාලන සේවයෙන් සහකාර කම්කරු කොමසාරිස්වරුන් ලෙස 12ක්ද, ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයෙන් 05 දෙනෙකුද, පර්යේෂණ සහකාර තනතුර සඳහා එක් නිලධාරියෙකුද කම්කරු දෙපාර්තමේන්තුවට එක් විය. කම්කරු දෙපාර්තමේන්තුවේ සේවයේ නියුතුව සිටින මාණ්ඩලික නිලධාරීන් දිරිගන්වනු පිණිස හා ඔවුනට අභිප්‍රේරණයක් ලබා දී වඩාත් ඵලදායී සේවයක් ප්‍රාර්ථනයෙන් යුතුව විදේශ පුහුණු වීම් පාඨමාලා හා සම්මන්ත්‍රණ සඳහා නිලධාරින්ට සහභාගී වීමට 2014 වර්ෂයේදී ඉඩකඩ සලසා දෙන ලදී.

**සැලසුම් පර්යේෂණ පුහුණු හා ප්‍රකාශන අංශය**

සැලසුම් පර්යේෂණ පුහුණු හා ප්‍රකාශන අංශය කම්කරු දෙපාර්තමේන්තුවේ ඉදිරි සැලසුම් ක්‍රියාත්මක කිරීම උදෙසා වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීමත්, එම සැලැස්ම නිශ්චිත මෙහෙයුම් හා ඇගයීම් ක්‍රියාවලියක් යටතේ ප්‍රගතිය පිළිබඳ පසු විපරම් කරමින් වර්ෂය අවසන් වන විට ඉලක්ක සපුරාගත් සාධනීය වැඩපිළිවෙලක් බවට පත් කිරීමත්, වාර්ෂික පාලන වාර්තාව සකසා කම්කරු කොමසාරිස් ජනරාල් වෙත ඉදිරිපත් කිරීමත් සැලසුම් අංශයේ කාර්යභාරයෙන් කොටසක් ලෙස දැක්විය හැකිය. එමෙන්ම මෙම අංශයට අයත් වන තවත් ඉතා වැදගත් කටයුත්තක් ලෙස කම්කරු දෙපාර්තමේන්තුවේ සේවක පිරිස සිය වෘත්තීය අභිවර්ධනය උදෙසා අවශ්‍ය පුහුණු කිරීම් මගින් අභිප්‍රේරණය කිරීම දැක්විය හැකි අතර LISA හෙවත් Labour Inspection Statistical Analyze හෙවත් "කම්කරු සුපරීක්ෂණ සංඛ්‍යාත්මක විශ්ලේෂණය" නමැති පරිගණක වැඩසටහන මෙහෙයවීම හා එම පරිගණක පාඨමාලාව හදාරනු ලබන කම්කරු නිලධාරීන් උදෙසා TAB පරිගණක ලබාදීමත් සැලසුම් පර්යේෂණ පුහුණු හා ප්‍රකාශන අංශයේ වගකීම් අතරට අයත් වන්නකි.

අවිස්සාවේල්ල වෙරළුපිටිය ප්‍රදේශයේ පිහිටා ඇති කම්කරු දෙපාර්තමේන්තුව සතු ගොඩනැගිල්ලේ මේ වන විටත් අරඹා ඇති නේවාසික පුහුණු මධ්‍යස්ථානයට අදාළ සංවර්ධන කටයුතුද සැලසුම් පර්යේෂණ පුහුණු හා ප්‍රකාශන අංශයට අයත් කටයුත්තක් ලෙස දැක්විය හැකිය.

දෙපාර්තමේන්තුවේ අවශ්‍යතා සපුරා ගැනීම උදෙසා මෙන්ම, ජාතික අවශ්‍යතා මත මෙම අංශය මගින් අදාළ පර්යේෂණ කටයුතු සිදු කරනු ලබන අතර, වාර්ෂික රැකි රක්ෂා සමීක්ෂණය සාමාන්‍ය ඉපැයීම් හා වැඩ කළ පැය ගණන පිළිබඳ සමීක්ෂණ වාර්තාව ප්‍රකාශයට පත් කිරීම කම්කරු දෙපාර්තමේන්තුව මගින් සිදු කරනු ලබයි. එමගින් ලබා ගත් දත්ත පිළිබඳව මෙන්ම කාලීන වැදගත්කමක් පවතින තොරතුරු පිළිබඳ ප්‍රකාශන එළිදැක්වීමද සැලසුම් පර්යේෂණ පුහුණු හා ප්‍රකාශන අංශයේ කාර්යභාරය ලෙස දැක්විය හැක.

**පුස්තකාලය හා කම්කරු කෞතුකාගාරය**

සේවා සේවක ප්‍රජාවගේ අභිවර්ධනයට අදාළව හඳුනාගත් අවශ්‍යතාවයන් හා ගැලපෙන පරිදි විෂයානුබද්ධ තොරතුරු රැස් කිරීම, අවශ්‍යතා අනුව එම දැනුම විසිරණය කිරීමට මඟ පෑදීම, දෙපාර්තමේන්තුවේ සේවකයන්ට හා පොදු මහ ජනතාවට කම්කරු ක්ෂේත්‍රය පිළිබඳව දැනුම ව්‍යාප්ත කිරීම කම්කරු දෙපාර්තමේන්තුවේ පුස්තකාලයේ ප්‍රධානතම කාර්යභාරය බවට පත් වී ඇත. එමෙන්ම කම්කරු දෙපාර්තමේන්තුව සතු කෞතුකාගාරය ශ්‍රී ලංකාවේ කම්කරු ක්ෂේත්‍රය ආරම්භයේ සිට විකාශනය වූ අයුරු අපූර්ව අන්දමින් විකාශනය කරනු ලබයි. එමෙන්ම කම්කරු ක්ෂේත්‍රය හා බැඳී පවතින පැරණි අණපනත් හා කම්කරු ක්ෂේත්‍රය හා බැඳී පවතින ලේඛණයන් සංරක්ෂණය කිරීමද කම්කරු දෙපාර්තමේන්තුවේ කම්කරු කෞතුකාගාරය සතු කාර්යභාරයක් වී ඇත.

**භෞතික සම්පත් සංවර්ධනය**

කම්කරු දෙපාර්තමේන්තුව සතු භූමියේ මහල් 36කින් යුතුව ඉදිවීමට නියමිත "මෙහෙවර පියස" ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු මේ වන විට ඉතා කඩිනමින් ඉදිවෙමින් පවතින බැව් දෘශ්‍යමානව පවතින අතර 2014 වසර අවසානයේදී මහල් 05ක මූලික කටයුතු නිමවෙමින් පැවතිනි. මීට අමතරව පහත දැක්වෙන ප්‍රාදේශීය කාර්යාලවල ඉදිකිරීම් කටයුතු සිදු වෙමින් පවතී. එම ඉදිකිරීම් අවිස්සාවේල්ල, මීගමුව, පොළොන්නරුව, බෙලිඅත්ත, මුලතිව්, කිලිනොච්චි, යාපනය වැනි නගරවල සිදුවෙමින් පවතී.

# සංඛ්‍යාලේඛන සංග්‍රහය

## කාර්මික සම්බන්ධතා අංශය

| | | 2011 | 2012 | 2013 | 2014 |
|---|---|---|---|---|---|
| **කාර්මික ආරවුල් පිළිබඳ සංඛ්‍යාලේඛන** | | | | | |
| | වාර්තා වූ සංඛ්‍යාව | 3,756 | 3,702 | 3,204 | 2,602 |
| | විසඳූ සංඛ්‍යාව | 3,384 | 3,695 | 3,077 | 2,589 |
| ලියාපදිංචි කරන ලද සාමූහික ගිවිසුම් සංඛ්‍යාව | | 66 | 43 | 34 | 50 |
| **වෘත්තීය සමිති කටයුතු** | | | | | |
| | ලියාපදිංචි කරන ලද වෘත්තීය සමිති / සම්මේලන | 76 | 114 | 108 | 125 |
| | අවලංගු කරන ලද වෘත්තීය සමිති / සම්මේලන | 38 | 02 | 114 | 255 |
| **කාර්මික අධිකරණ කටයුතු** | | | | | |
| | අනිවාර්ය බේරුම්කරණයට යොමු කිරීම | 69 | 43 | 49 | 53 |
| | ප්‍රධාන නිකුත් කිරීම | 35 | 26 | 35 | 42 |
| **වැඩවර්ජන වාර්තා වීම පිළිබඳ සංඛ්‍යාලේඛන** | | | | | |
| වැඩවර්ජන වාර්තා වීම | වතු | 14 | 14 | 22 | 31 |
| | ආයතන | 07 | 20 | 20 | 07 |
| සහභාගි වූ සේවක සංඛ්‍යාව | වතු | 2,713 | 4,338 | 5,031 | 4,833 |
| | ආයතන | 3,742 | 5,626 | 6,088 | 1,618 |
| අහිමි වූ මිනිස් දින ගණන | වතු | 9,877 | 25,043 | 41,669 | 29,165 |
| | ආයතන | 15,543 | 10,774 | 38,754 | 8,158 |
| **සේවය අවසන් කිරීමේ අංශයේ කටයුතු** | | | | | |
| | පැමිණිලි යොමු වූ සංඛ්‍යාව | 86 | 92 | 134 | 149 |
| | පැමිණිලි විසඳූ සංඛ්‍යාව | 111 | 143 | 112 | 148 |
| සේවය අවසන් කිරීම සම්බන්ධ ඉල්ලුම්පත් සම්බන්ධයෙන් අවසර දීම | | 29 | 31 | 41 | 51 |
| **සමාජ කතිකාවත පිළිබඳ වැඩසටහන් පැවැත්වීම** | | | | | |
| සමාජ කතිකා අංශය මඟින් | පැවැත්වූ වැඩසටහන් සංඛ්‍යාව | 98 | 153 | 107 | 88 |
| | සහභාගි වූ සේවක සංඛ්‍යාව | 4,864 | 4,751 | 6,560 | 5,433 |
| දිස්ත්‍රික් හා උප කාර්යාල මඟින් | පැවැත්වූ වැඩසටහන් සංඛ්‍යාව | 124 | 225 | 214 | 199 |
| | සහභාගි වූ සේවක සංඛ්‍යාව | 4,478 | 7,902 | 7,768 | 6,861 |

2014.12.31 දින වන විට ක්‍රියාත්මක වෘත්තීය සමිති ගණන - 2,009

2014.12.31 දින වන විට ක්‍රියාත්මක වෘත්තීය සම්මේලන ගණන - 26

**නීති ක්‍රියා අංශය**

| පනත | ගොනු කළ නඩු සංඛ්‍යාව | | | |
|---|---|---|---|---|
| | 2011 | 2012 | 2013 | 2014 |
| පාර්තෝෂික ගෙවීම් පනත | 4,092 | 3,404 | 2,371 | 2,044 |
| කාර්මික ආරවුල් පනත | 72 | 77 | 126 | 146 |
| සේවය අවසන් කිරීමේ පනත | 65 | 59 | 58 | 36 |
| පඩිපාලක සභා ආඥා පනත | 238 | 290 | 203 | 244 |
| සාප්පු හා කාර්යාල සේවක පනත | 80 | 132 | 112 | 88 |
| ප්‍රසූතිකාධාර පනත | 01 | 02 | 05 | 03 |
| ස්ත්‍රීන් තරුණ අය සහ ළමයින් සේවයේ යෙදවීම පිළිබඳ පනත | 05 | 10 | 07 | 11 |
| සේවක අර්ථසාධක අරමුදල් පනත | 3,483 | 3,210 | 3,415 | 3,244 |
| කම්කරු විනිශ්චය සභා නියෝග | 153 | 165 | 144 | 183 |
| අයවැය සහන දීමනා පනත | 54 | 134 | 22 | 32 |
| අනුමත අර්ථසාධක අරමුදල් | - | 07 | 01 | 07 |

**විශේෂ විමර්ශන අංශය**

| | 2011 | 2012 | 2013 | 2014 |
|---|---|---|---|---|
| පැමිණිලි පරීක්ෂණ | 241 | 264 | 122 | 216 |
| ගණනය කරන ලද සේ.අ.අ. හිඟ වටිනාකම (රු. දහස්) | 153,483 | 313,770 | 28,012 | 32,416 |
| ගණනය කරන ලද හිඟ ව්‍යවස්ථාපිත මුදල් වටිනාකම (රු. දහස්) | 12,295 | 40,831 | 5,814 | 2,970 |

**සේවක අර්ථසාධක අරමුදල් අංශය**

| | 2011.12.31 දිනට | 2012.12.31 දිනට | 2013.12.31 දිනට | 2014.12.31 දිනට |
|---|---|---|---|---|
| සමස්ත සාමාජික ගිණුම් සංඛ්‍යාව | 13,993,089 | 14,559,328 | 15,203,073 | 15,449,037 |
| මුළු සේවායෝජක සංඛ්‍යාව | 192,044 | 198,893 | 204,777 | 206,629 |
| අරමුදලේ වටිනාකම (රු. මිලියන) | 1,017,7 04 | 1,144,409 | 1,299,974 | 1,486,931 |
| සක්‍රිය සාමාජික සංඛ්‍යාව (මිලියන) * | 2.21 | 2.34 | 2.40 | 2.01 |
| සක්‍රිය සේවායෝජක සංඛ්‍යාව ** | 64,562 | 68,140 | 69,148 | 71,000 |

| | | 2011 | 2012 | 2013 | 2014 |
|---|---|---|---|---|---|
| නව ලියාපදිංචි කිරීම | සේවාදායකයින් | 750,338 | 785,078 | 813,010 | 429,605 |
| | සේවායෝජකයින් | 6,403 | 7,195 | 7,802 | 6,800 |
| ප්‍රතිලාභ ගෙවීම් | ප්‍රතිලාභීන් සංඛ්‍යාව | 120,301 | 115,654 | 114,275 | 127,942 |
| | ගෙවූ ප්‍රතිලාභ මුදල (රු. මිලියන) | 47,311 | 48,712 | 50,407 | 64,325 |
| දායක මුදල් රැස් කිරීම (රු. මිලියන) | | 61,879 | 70,171 | 77,335 | 83,000 |
| සේ.අ.අ. නිවාස ණය | අනුමත කළ අයදුම්පත් සංඛ්‍යාව | 20,041 | 11,234 | 16,268 | 17,747 |
| | අනුමත කළ ණය මුදල් වටිනාකම (රු. මිලියන) | 6,355 | 3,973 | 6,914 | 8,000 |

* වර්ෂය තුළ එක්වරක් හෝ දායක මුදල් ගෙවන ලද සාමාජික ගිණුම්

** වර්ෂය තුළ එක්වරක් හෝ සේවකයන් වෙනුවෙන් දායක මුදල් ගෙවන ලද සේවායන්

කර්මාන්තමය සුරක්ෂිතතා අංශය

| | 2011 | 2012 | 2013 | 2014 |
|---|---|---|---|---|
| ලියාපදිංචි කරන ලද මුළු කර්මාන්තශාලා සංඛ්‍යාව (වර්ෂය අවසාන දිනට) | 20,971 | 22,459 | 23,974 | 25,236 |
| සිදු කරන ලද පරීක්ෂණ සංඛ්‍යාව | 4,749 | 6,700 | 6,372 | 5,067 |
| පරීක්ෂකයින් (ඉංජිනේරුවරුන්) සංඛ්‍යාව | 27 | 28 | 28 | 30 |
| පිඹුරුපත් අනුමැතිය | 122 | 106 | 97 | 111 |
| දේශන හා සම්මන්ත්‍රණ | 294 | 229 | 218 | 17 |

වෘත්තීය ස්වස්ථතා අංශය

| | 2011 | 2012 | 2013 | 2014 |
|---|---|---|---|---|
| කර්මාන්තශාලා පරීක්ෂණ සංඛ්‍යාව | 220 | 410 | 352 | 250 |
| දැනුවත් කිරීමේ වැඩසටහන් සංඛ්‍යාව | 193 | 137 | 190 | 296 |

සැලසුම් පර්යේෂණ පුහුණු හා ප්‍රකාශන අංශය

| | 2011 | 2012 | 2013 | 2014 |
|---|---|---|---|---|
| මාණ්ඩලික නිලධාරී පුහුණු වැඩසටහන් | 22 | 4 | 14 | 18 |
| කළමනාකරණ සහකාර පුහුණු වැඩසටහන් | 14 | 8 | 17 | 23 |
| පරිගණක පුහුණු වැඩසටහන් | 16 | 33 | - | 17 |
| වෙනත් පුහුණු වැඩසටහන් | 2 | 2 | 2 | 6 |
| පශ්චාත් උපාධි පාඨමාලා | 26 | 20 | 41 | 81 |
| බාහිර පුහුණු | 37 | 57 | 23 | 18 |
| ප්‍රගති සමාලෝචන රැස්වීම් | 7 | 5 | 6 | 5 |

**මුදල් අංශය**

| | | 2012 | 2013 | 2014 |
|---|---|---|---|---|
| පුනරාවර්තන වියදම් | ප්‍රතිපාදනය (රු.) | 967,407,000.00 | 1,100,630,000 | 1,138,550,000 |
| | වියදම් (රු.) | 953,894,760.00 | 1,016,129,728 | 1,117,107,412 |
| ප්‍රාග්ධන වියදම් | ප්‍රතිපාදනය (රු.) | 372,365,000.00 | 760,275,000 | 373,200,000 |
| | වියදම් (රු.) | 299,512,890.00 | 732,936,934 | 306,883,421 |

**ආයතන අංශය**

| | 2012 | 2013 | 2014 |
|---|---|---|---|
| වර්ෂය ආරම්භයේ සිටි මුළු සේවක සංඛ්‍යාව | 2,271 | 2,219 | 2,169 |
| • දෙපාර්තමේන්තුව විසින් සිදු කරන ලද නව බඳවා ගැනීම් | 23 | 1 | 32 |
| • ඒකාබද්ධ සේවයේ නව පත්වීම් ලෙස දෙපාර්තමේන්තුවට පැමිණීම් | 30 | 37 | 163 |
| • ස්ථාන මාරු වීම් (ශුද්ධ) | (7) | (1) | (10) |
| • වෙනත් හේතූන් මත දෙපාර්තමේන්තු කාර්ය මණ්ඩලයට එකතු වීම් | 1 | - | 5 |
| • විශ්‍රාම යාම් | (52) | (55) | (50) |
| • වෙනත් හේතූන් මත දෙපාර්තමේන්තු කාර්ය මණ්ඩලයෙන් ඉවත් වීම් | (47) | (32) | (53) |
| වර්ෂය අවසානයේ මුළු සේවක සංඛ්‍යාව | 2,219 | 2,169 | 2,256 |

# ඇමුණුම

## දෙපාර්තමේන්තුවේ සංවිධාන ව්‍යුහය

